# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,200 - 2020 ඔක්තෝබර් මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2020.10.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1706 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1713 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 නොවැම්බර් මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 නොවැම්බර් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1703 B 82073 — 5,403 (2020/10)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලටින් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## නීති නිලධාරි (විධායක නිලධාරි ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩුව (01) පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පරිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :*

(i) අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් :
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද :
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයෙකු වශයෙන් වසර තුන(03) කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබා ගත් කාලය, දිනය හා නිල මුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.) ;

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර තුන (03) කට නොඅඩු, පහත දැක්වෙන කාර්යයන්වලට අදාළ පළපුරුද්ද ලබා තිබීම.

(අ) නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.

(ආ) ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු.

(ඇ) අදාල අණපනත් සම්බන්ධව නෛතික කටයුතු.

(ඈ) පනත් කෙටුම්පත්, චක්‍රලේඛ,රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු.

(ඉ) විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ හෝ පරීක්ෂණ කටයුතු.

(මෙම කරුණු ලේකම්,දෙපාර්තමේන්තු ප්‍රධානි විසින් නිකුත් කළ සහතිකයක් මගින් හා ලේඛන මගින් සනාථ කළ යුතුය.)

(iii) *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) *වෙනත් සුදුසුකම්* :

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. තනතුර බඳවාගෙන වසර 03ක් ඇතුලත

බඳවා ගැනීමේ පාරිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි සඳහන් විධිවිධාන හා ඊට අනුශාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත් වී වසර පහක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද,දෙපාර්තමේන්තු ගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

4. *වයස් සීමාව :*
ඉල්ලුම්කරුවන් ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස අවු. 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

5. *වැටුප් පරිමාණය :*
මෙම තනතුරට රු. 47,615-10 x 1335-8 x 1630-17 x 2170 - රු.110,895/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි අංක SL 1-2016 වැටුප් කාණ්ඩය වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

6. *යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පරිපාටිය පදනම් කරගනු ලැබේ :-*

| *අනු අංකය* | *විෂය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් :<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද නීති ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධිය<br><br>රජය පිළිගත් ආයතනයක් විසින් පිරිනමන ලද නීති ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා ලද පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් නීති ඩිප්ලෝමාව (වසරකට නොඅඩු)<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ උපාධිය,<br>● පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>● දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා<br>● දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා<br>● සාමාන්‍ය නීතිවේදී උපාධිය<br><br>නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා<br><br>**සටහන** : ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වී තිබේනම් පමණක් ලකුණු 05ක් ලබා දිය යුතුයි. (උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | 25<br><br>20<br><br>15<br>10<br>07<br>05<br><br>10<br><br>05 | 25 |
| 02 | අතිරේක වෘත්තීය පළපුරුද්ද :<br><br>I. අතිරේක වෘත්තීය සුදුසුකම්<br>රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන ලද නීති ක්ෂේත්‍රයට අදාළ අවුරුද්දකට වැඩි ඩිප්ලෝමාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 10 බැගින්) | 10 | 35 |

| අනු අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන නීති ක්ෂේත්‍රයට අදාළ මාස 06කට වැඩි හා අවුරුද්දකට අඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්)<br><br>රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන නීති ක්ෂේත්‍රයට අදාළ මාස 03කට වැඩි හා මාස 06 අඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>(එක් පාඨමාලාවකට ලකුණු 03 බැගින්)<br>(අංක 01 යටතේ වන ලකුණු ලබා දුන් සහතික හැර වෙනත් )<br><br>II. අතිරේක පළපුරුද්ද :<br><br>අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 2(ii) හි සඳහන් පළපුරුද්ද හැර (මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන වසර 03ක සේවා කාලය හැර)<br><br>-එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 25ක්<br>-මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු : ලකුණු 02<br><br>● අවුරුදු 15 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද (මෙම සේවා කාලය,අයදුම්කරු වෙනුවෙන් නිකුත් කරනු ලබන සහතිකය තුළම සඳහන් කළ යුතුය.) නීතිඥවරයෙකුගෙන් හෝ ජනාධිපති නීතිඥවරයෙකුගෙන් හෝ විනිසුරුවරයෙකුගෙන් හෝ ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.<br><br>● ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති රජයේ නිලධාරීන් හෝ පෞද්ගලික අංශයේ නිලධාරීන් සඳහා ආයතන ප්‍රධානි විසින් අතිරේක පළපුරුද්ද සනාථ කිරීමේදී අයදුම්කරු නීතිමය තනතුරක සේවය කරන බවට සේවා සහතිකයක්/සහතික පත් මගින් සනාථ කළ යුතුය) | 25 | |
| 03 | තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක වසර 01/පැය 1500 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>-මාස 06/පැය720<br>-මාස03/පැය 360<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) | <br><br>10<br><br>07<br><br><br>05<br>03 | 10 |

| අනු අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 04. | භාෂා ප්‍රවීණතාව<br><br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/ උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය.)<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජය පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ වසර 01/පැය 1500කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබද සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා<br>-මාස 06/පැය720<br>-මාස03/පැය 360<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) | <br><br>15<br><br><br><br>10<br><br><br><br><br><br><br><br>07<br>05 | 15 |
| 05. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය<br>(i) සාමාන්‍ය දැනීම හා බුද්ධිය<br>(ii) නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබද දැනුම<br>(iii) පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය | <br>05<br>05<br>05 | <br>15 |
| | එකතුව | | 100 |

**සටහන**
යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරනු ලබන සහතික පත්වල අදාළ කාලසීමාවන් පිළිබඳ සඳහන් නොවන්නේ නම්, එවැනි සහතිකපත්‍රවලට අදාළ කාලසීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාලසීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතික පත්‍ර ලකුණු ලබාදීම සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

7. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :
යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික පත්වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

8. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරයः-
i. අයදුම්පත් 2020 නොවැම්බර් මස 30 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කොමසාරිස්
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බී කොටස, 03 වන මහල
සෙත්සිරිපාය II අදියර
බත්තරමුල්ල.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 03 දක්වාත් දෙවැනි පිටුව 04 සිට 05 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

iii. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රු.47,615ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

v. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් , තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

vi. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

9. සාවද්‍ය තොරතුරු සැපයීම : ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඊට අදාල ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

12. 2019.01.17 දිනැතිව පළකරන ලද පුවත්පත් දැන්වීම අනුව අයදුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන් ද නැවත අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

13. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ. එම්. එස්. ඩී. ජයසේකර
ලේකම්,

2020 ඔක්තෝබර් මස 29 වැනි දින
කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය

ආදර්ශ අයදුම්පත්‍රය

**කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල -2 / දෙමළ -3/ ඉංග්‍රීසි -4

*සටහන* :- අයදුම් කරනු ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

---

01. 1.1 සම්පූර්ණ නම (මයා /මිය/මෙය) :————.
(සිංහලෙන් / දෙමළෙන් )

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
උදා: GUNAWARDHANA, M.G.B.S.K.
1.3 මුලකුරු සමඟ නම (මයා/මිය මෙය) :————.
(සිංහලෙන් /දෙමළෙන්) :————.
1.4 මුලකුරු සමඟ නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. 2.1 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන් /දෙමළෙන්)
2.2 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.3 දුරකථන අංකය :————.

03. 3.1 ස්ත්‍රී /පුරුෂ භාවය : පුරුෂ 0 (අදාළ කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී 1 ☐

3.2 විවාහක / අවිවාහක බව : විවාහක -1 (අදාළ කොටුව තුළ ලියන්න)
අවිවාහක -2 ☐

3.3 උපන් දිනය : ☐☐☐☐ ☐☐ ☐☐

3.4. 2020.11.30 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.5 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

04. 4.1 සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව ලබා ගෙන ඇති සුදුසුකම් පිළිබඳ විස්තර :

| සුදුසුකම් ලබා ගත් ආයතනය | ලබාගත් දිනය |
|---|---|
| .................................... | .................. |
| .................................... | ................... |

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දිනය :

4.2 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාල විස්තර :-

4.3 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :..........................................................................
..........................................................................
4.4 අතිරේක වෘත්තීය සුදුසුකම් ..........................................................................
..........................................................................
..........................................................................
4.5 අතිරේක පළපුරුද්ද ..........................................................................
..........................................................................
4.6 භාෂා ප්‍රවීණතාව :..........................................................................
..........................................................................
4.7 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................

05. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(අදාල කොටුවේ ලකුණ (✓) යොදන්න)(ඔව් නම් විස්තර කරන්න )

| ඔව් | නැත |
|---|---|

.......................................................
.......................................................

06. අයදුම්කරුගේ සහතිකය ඃ

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්,පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත්වන බවත් ප්‍රකාශ කරමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

07. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................ මයා / මිය /මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු / ඇය මා ඉදිරිපිටදී .................. දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද, සහතික කරමි.

————,
දිනය :————. අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :————.
තනතුර :————.
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

08. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ඃ (රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් සඳහා පමණි)

ඉහත විස්තර සඳහන් .............................. මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු /ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාව යොදන්න)

10-1065

---

## බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

### සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**රාජ්‍ය නැටුම් කණ්ඩායමේ නැටුම් ශිල්පී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නැටුම් ශිල්පී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම වෙනුවෙන් 2020.09.25 දින පළකරන ලද නිවේදනයේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2020.11.13 ලෙස සංශෝධනය කරන ලදී.

**රාජ්‍ය සංගීත කණ්ඩායමේ සංගීත ශිල්පී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සංගීත ශිල්පී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම වෙනුවෙන් 2020.09.25 දින පළකරන ලද නිවේදනයේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2020.11.13 ලෙස සංශෝධනය කරන ලදී.

තරණි අනෝජා ගමගේ,
අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

10-1221

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස් ලූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරී තනතුරේ II ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය -2020

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති ගොවිජන සංවර්ධන නිලධාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 උක්ත විභාගය සඳහා පෙනී සිටීමට අපේක්ෂා කරන සියලුම අයදුම්කරුවන්ගෙන් 2020.10.29 දින සිට 2020.12.04 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. 2021 පෙබරවාරි මස තුළ විභාග දෙපාර්තමේන්තුව මඟින් විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට යා කර ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවට ද ශීර්ෂ අංක 08 සිට 10 තෙක් දෙවන පිටුවට ද ශීර්ෂ අංක 11 සිට 17 තෙක් ඊළඟ පිටුවට ද ඇතුළත් වන ලෙස සකස් කර ගත යුතුය.

ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

1.2 අපේක්ෂකයා තමා විභාගයට පෙනී සිටීමට අදහස් කරනු ලබන භාෂා මාධ්‍යයෙන්, තම අත් අකුරින් ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතු අතර ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂයේ භාෂා මාධ්‍යයට අදාළ අංකය දී ඇති කොටුවේ නිවැරදිව දැක්විය යුතුය. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

1.3 ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද , දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

1.4 මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් කොළඹදී පමණක් පවත්වනවා ඇත.

1.5 සියලුම අයදුම්කරුවන් සම්පූර්ණ කරන ලද අයදුම්පත තම ආයතන ප්‍රධානියා මඟින් 2020.12.04 දින හෝ එදිනට පෙර ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමුකළ යුතුය.

ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළින් ''ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරී තනතුරේ II ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය -2020" ලෙස සඳහන් කළ යුතුය.

1.6 විභාග නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කොට එම ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ අලවා ඇත්ද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතුය. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

2. *සාමාන්‍ය සුදුසුකම් :*

2.1 ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

2.2 විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

2.3 සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

3. *බඳවා ගැනීමේ සුදුසුකම් :*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සහිත, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරක ස්ථිර කර ඇති හා වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම ;

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත් හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01)

(සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරේ හෝ ගොවිජන සේවා මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර තනතුරේ ස්ථිර කර ඇති එම තනතුරක දෙවන ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියකු වීම.

4. *බඳවා ගැනීමේ ක්‍රමය :*

4.1 ලිඛිත තරග විභාගයේ කොන්දේසි :

ලිඛිත විභාගයේ එක් එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන් ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාවේ කුසලතා අනුපිළිවෙළට පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදු කෙරේ.

4.2 ලිඛිත තරග විභාගයට අදාළ විෂය නිර්දේශය :

විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 1/2 යි - මුළු ලකුණු 100 යි
2. විෂයානුබද්ධ දැනුම - කාලය පැය 01 1/2 යි - මුළු ලකුණු 100 යි

(සාමර්ථ්‍ය සඳහා එක් එක් විෂයට, මුළු ලකුණුවලින් 40% ක් හෝ ඊට වැඩියෙන් අපේක්ෂකයින් විසින් ලබා ගත යුතුය.)

01. බුද්ධි පරීක්ෂණය
මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත්තේ අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයන්, සිතෙහි විශ්ලේෂණ තත්ත්වයන්, තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා ය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්නවලින් සමන්විත වේ.

02. විෂයානුබද්ධ දැනුම
මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය හා 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම මෙයින් අපේක්ෂා කෙරේ.

4.3 සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

4.4 විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයින්ට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු දිය යුතුය.

4.5 *ප්‍රතිඵල නිකුත් කිරීම :*

ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයය සඳහා ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතා අනුපිළිවෙළට සකස් කරන ලද ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත ලබාදෙනු ඇත.

සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

5. *වැටුප් පරිමාණය (මාසික) :*
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි MN-05-2016 යටතේ රු.34,605 - 10x660 - 11x775 -15x930 - රු. 63,460.

6. *උසස් කිරීමේ පරිපාටිය :*
ගොවිජන සංවර්ධන නිලධාරී තනතුරේ බඳවා ගැනීම් පරිපාටිය අදාළ වේ.

7. *විභාග ගාස්තු :*

අයදුම්කරු විසින් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු රු. 600 ක මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් හෝ උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාගය සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොන යම් හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ. මතු ප්‍රයෝජනය සඳහා කුවිතාන්සියේ පිටපතක් ළඟ තබා ගැනීම සුදුසුය.

8. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

9. *අත්සන සහතික කිරීම :*

ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු හෝ සාමදාන විනිශ්චකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු හෝ නීතිඥවරයකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියකු හෝ රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතුය. විභාගය ආරම්භ වන දිනයේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයයි. එසේ අත්සන සහතික කරවා නොගත් ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් කරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

10. නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර

නිකුත් කරනු ඇත.විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත.නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන(ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතුය.එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම,අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය.අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්,එම විස්තර සමඟ ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත.එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත,විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

11. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම,ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

13. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට/ඇයට සිදුවනු ඇත.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 06 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
තැ.පෙ.537,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරී තනතුරේ II ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2020**

Limited Competitive Examination for Recruitment to the Post of Agrarian Development Officer Grade II in the Department of Agrarian Development - 2020

| ලිඛිත විභාගයට පෙනී සිටින මාධ්‍යය : |
|---|
| සිංහල - 2 |
| දෙමළ - 3 |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1. (i) මුල ්කුරු සමග නම (මුල ්කුරු අගට යොදා ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : SUNIL, A.B.)

(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(iii) සම්පූර්ණ නම (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ii) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

4. දැනට සේවය කරන දිස්ත්‍රික්කය හා සේවා ස්ථානය :————.

5. ස්ත්‍රී/ පුරුෂ භාවය :- පුරුෂ - 0 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
ස්ත්‍රී - 1

6. ජංගම දුරකථන අංකය :- | | | | | | | | | | |

7. රාජකාරි දුරකථන අංකය :- | | | | | | | | | | |

8. අධ්‍යාපන සුදුසුකම් :

8.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය :

| වර්ෂය | | |
|---|---|---|
| විභාග අංකය | | |
| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

8.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය :

| වර්ෂය | | |
|---|---|---|
| විභාග අංකය | | |
| අනු අංකය | විෂයය | ශ්‍රේණිය |
| | | |
| | | |
| | | |
| | | |

9. උපාධිය ලබා ඇත්නම් -

I ලබා ඇති උපාධිය හා වර්ෂය :————.
II උපාධිය ලබා ඇති විශ්වවිද්‍යාලය :————.
III සාමාර්ථයේ ස්වභාවය සාමාන්‍ය/ගෞරව I පන්තිය/II පන්තිය (ඉහළ/පහළ)
විශේෂ/ගෞරව I පන්තිය/ II පන්තිය (ඉහළ/පහළ)
IV අදාළ විෂයයන් :————.

10. I මුල් පත්වීමේ දිනය :————.
II තනතුර ස්ථිර කරන ලද දිනය :————.
III මෙම දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ගත තනතුරක වසර 05 ක සේවා කාලය සම්පූර්ණ වන දිනය (උපාධිය ඇති නිලධාරීන්) :————.
IV මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර සහ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් සඳහා II වන ශ්‍රේණියට පත්වූ දිනය :————.
V II ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලය සම්පූර්ණ වන දිනය :————.

11. පරිවාස කාලය දීර්ඝ කිරීම නිසා ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 11:10:1 යටතේ වේතනාධික විලම්භනය කර තිබූ කාලය :————.

12. විනය දඬුවම් ලබා ඇත්නම් එම දඬුවම කුමක්ද යන්න :————.

13. වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම් අදාළ කාලය :————.

14. විභාග ගාස්තු ඃ

I. ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය :————.
II. ගෙවූ මුදල :————. III. ගෙවූ දිනය :————.
IV. ලදුපත් අංකය :————.

| |
|---|
| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) |

15. අයදුම්කරුගේ ප්‍රකාශය ඃ
ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බවත්, තනතුර ස්ථිර කර ඇති බවත්, අදාළ සියලුම සුදුසුකම් සපුරා ඇති බවත්, විනය ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත් තහවුරු කරමි.

දිනය :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ....................................මයා /මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ ඇය මා ඉදිරිපිටදී .................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

සහතික කරන අයගේ -
නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාව)

17. නියෝජ්‍ය /සහකාර කොමසාරිස්ගේ නිර්දේශය :

................. තනතුර දරන .......................... මහතා/මිය/මෙනවිය විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව හා අදාළ මූලාශ්‍ර අනුව සත්‍ය හා නිවැරදි බවත් ඔහු/ඇය ............ දිනට ඉහත විභාගය සඳහා ඉදිරිපත් වීමට අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති බැවින් අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

ආයතන ප්‍රධානියාගේ -
නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාව)

10-1147

---

## වී හා ධාන්‍ය කාබනික පොහොර, ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ලූනු, හා අර්තාපල්, වගා ප්‍රවර්ධන බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික රාජ්‍ය අමාත්‍යාංශය

### ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණය (MN 1 - 2016A) යටතේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2020

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිවයින පුරා පුරප්පාඩු වී ඇති කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරු සඳහා දිස්ත්‍රික් මට්ටමින් බඳවාගැනීම සඳහා පහත සඳහන් කොන්දේසි වලට යටත්ව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.මෙම විභාගය 2021 වර්ෂයේ පෙබරවාරි මස තුළ විභාග දෙපාර්තමේන්තුව විසින් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

1. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි* :

1.1 කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරු සඳහා කාන්තා සහ පිරිමි යන දෙපාර්ශ්වයටම අයදුම් කල හැකිය.

1.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත්වේ. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු අතර රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

1.3 රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් 2009.02.20 දිනැති අංක1589/30 ගැසට් පත්‍රයේ පළ කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අදාළ වේ.

1.4 තෝරාගනු ලබන අයදුම්කරුවන් තම මුල්පත්වීම් ලබන දිස්ත්‍රික්කය තුළ අනිවාර්යයයෙන් වසර 05ක් සේවය කළ යුතුය.

1.5 තෝරාගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද, යටත් විය යුතුය.

2. *සාමාන්‍ය සුදුසුකම්* :

2.1 ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

2.2 යහපත් චරිතයකින් හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු, මනා ශාරීරික හා මානසික සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

2.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි පුද්ගලයන් විය යුතුය. ඒ අනුව 2002.12.04 දිනට හෝ ඊට පෙර හා 1990.12.04 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

2.4 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි V වන පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතුය.

2.5 සියලුම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වාසන්න වසර 06 ක කාලසීමාවක් ඇතුළත අයදුම්කරන දිස්ත්‍රික්කයේ අවම වශයෙන් වසර 03ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් සහිත විය යුතු අතර තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද ඡන්ද හිමි නාම ලේඛනයේ උපුටනයක් ඉදිරිපත් කළ යුතුයි.

3. *අධ්‍යාපන සුදුසුකම් :*

අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම ;

සහ

ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

4. *වෙනත් සුදුසුකම්:*

4.1 වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.

4.2 සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

5. *බඳවා ගැනීමේ ක්‍රමය :*

5.1 ලිඛිත තරග විභාගයේ කොන්දේසි:

ලිඛිත විභාගයේ එක් එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන් ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාවේ කුසලතා අනුපිළිවෙළට අනුව දිස්ත්‍රික් පදනමින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදු කෙරේ.

5.2 ලිඛිත තරග විභාගයට අදාළ විෂය නිර්දේශය :

විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි - මුළු ලකුණු 100යි
2. කෘෂිකර්මය පිළිබඳ - කාලය පැය 01 යි - මුළු ලකුණු 100යි
   සාමාන්‍ය දැනුම

(සාමාර්ථය සඳහා එක් එක් විෂයට, මුළු ලකුණුවලින් 40% ක් හෝ ඊට වැඩියෙන් අපේක්ෂකයින් විසින් ලබා ගත යුතුය.)

5.2.1. බුද්ධි පරීක්ෂණය

මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත්තේ අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයත් ඔහුගේ සිතෙහි විශ්ලේෂණ තත්ත්වයත් ඔහුගේ තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහාය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ සහ ව්‍යුහගත ක්‍රමයට ගැලපෙන ප්‍රශ්න වලින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

5.2.2. කෘෂිකර්මය පිළිබඳ සාමාන්‍ය දැනුම

මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත්තේ අපේක්ෂකයාගේ කෘෂිකර්මය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම සඳහාය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ සහ ව්‍යුහගත ක්‍රමයට ගැලපෙන ප්‍රශ්න වලින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

5.3 සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ)

5.4 විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන් ම පවත්වනු ලැබේ. තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයින්ට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු දිය යුතුය.

5.5 ප්‍රතිඵල නිකුත් කිරීම :

ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයය සඳහා ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතා අනුපිළිවෙලට සකස් කරන ලද ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත ලබාදෙනු ඇත.

සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

6. *වැටුප් පරිමාණය (මාසික) :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි MN-01-2016 යටතේ රු.27,140 - 10x300 - 11x350 - 10x495 - 10x660 - 45,540/= මෙම වැටුප හිමිවන්නේ 2020.01.01 දින සිට වන අතර මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

7. *උසස් කිරීමේ පරිපාටිය :*

කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරේ බඳවා ගැනීම් පරිපාටිය අදාළ වේ.

8. *අයදුම් කිරීමේ ක්‍රමය :*

8.1 උක්ත විභාග සඳහා පෙනී සිටීමට අපේක්ෂා කරන සියලුම අයදුම්කරුවන් වෙනුවෙන් 2020.10.29 දින සිට 2020.12.04 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. 2021 පෙබරවාරි මස තුළ විභාග දෙපාර්තමේන්තුව මගින් විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට යා කර ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවට ද ශීර්ෂ අංක 08 සිට 10 තෙක් දෙවන පිටුවට ද 11 සිට 14 තෙක් තෙවන පිටුවට ද ඇතුළත් වන ලෙස සකස් කර ගත යුතුය. ඉල්ලුම්පත්‍රය

පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

8.2 අපේක්ෂකයා තමා විභාගයට පෙනී සිටීමට අදහස් කරනු ලබන භාෂා මාධ්‍යයෙන්, තම අත් අකුරින් ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතු අතර ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂයේ භාෂා මාධ්‍යයට අදාළ අංකය දී ඇති කොටුවේ නිවැරදිව දැක්විය යුතුය. ඉල්ලුම්කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

8.3 ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

8.4 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් උපලේඛනය - 1 යටතේ දක්වා ඇති දිස්ත්‍රික්කවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථාන වලදී පවත්වනවා ඇත. ඒ අනුව විභාගයට පෙනී සිටින දිස්ත්‍රික්කය හා ඊට අදාළ අංක පළමු හා දෙවන කැමැත්ත අනුව ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂයේ දක්වා ඇති කොටුව තුළ නිවැරදිව සඳහන් කළ යුතුය. විභාග සඳහා ඉල්ලුම් කළ දිස්ත්‍රික්කය/ දිස්ත්‍රික්ක පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. කිසියම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් නොමැති විට අයදුම්කරුගේ දෙවැනි කැමැත්ත අනුව හෝ ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත හෝ යොමු කරනු ඇත. යෝජිත දිස්ත්‍රික්ක සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කෙරෙනු ඇත.

8.4.1 "සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ"

8.5 පෞද්ගලික අයදුම්කරුවන් විසින් සෘජුවම ද, රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් ද 2020.12.04 දින හෝ ඊට පෙර ලැබෙන සේ සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍ර, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමුකළ යුතුය. ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළින් "ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2020" ලෙස සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.6 විභාග නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍ර යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට එම ලදුපත ඉල්ලුම්පතේ අදාළ කොටුවේ අලවා ඇත්ද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතුය. (සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

8.7 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

9. *විභාග ගාස්තු :*

අයදුම්කරු විසින් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු රු. 600 ක මුදල ඕනෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකට ගෙවිය යුතු අතර, ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් මුදල් භාර ගත් බවට ගො.සේ.ම / 2(අ) කුවිතාන්සිය අයදුම්කරුට ලබා දෙනු ඇත. එම කුවිතාන්සිය අයදුම්පත්‍රයේ නම් කරන ලද ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මතු ප්‍රයෝජනය සඳහා කුවිතාන්සියේ පිටපතක් ළඟ තබා ගැනීම සුදුසුය. කුමන හේතුවක් නිසා හෝ එම මුදල ආපසු ගෙවනු නොලැබේ.

10. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

11. *අත්සන සහතික කිරීම* :

අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු හෝ සමාදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු හෝ නීතිඥවරයකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියකු රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතුය. විභාගය ආරම්භ වන දිනයේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයයි. එසේ අත්සන සහතික නොකරන ලද ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් කරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

12. *අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය* :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත ;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

13. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

14. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට/ ඇයට සිදුවනු ඇත.

15. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් වන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 06 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
තැ.පෙ. 537,
කොළඹ 07.

උපලේඛන - I

විභාග මධ්‍යස්ථාන පිහිටුවිය යුතු දිස්ත්‍රික් අංක පහත දක්වෙන ලැයිස්තුවෙන් තෝරා ගන්න.

මෙම විභාගය පහත සඳහන් දිස්ත්‍රික්කවලදී පවත්වනු ඇත. අයදුම්කරුවන් තමන් පදිංචි ලිපිනයට ආසන්නතම දිස්ත්‍රික්කය තම විභාග මධ්‍යස්ථාන ලෙස තෝරාගත යුතු ය. විභාගයට පෙනී සිටින දිස්ත්‍රික් හා දිස්ත්‍රික්ක අංකය දිස්ත්‍රික්කය තම විභාග මධ්‍යස්ථාන ලෙස තෝරාගත යුතුය. විභාගයට පෙනී සිටින දිස්ත්‍රික් හා දිස්ත්‍රික්ක අංකය පහත සඳහන් වගුවට අනුව ඉල්ලුම්පත්‍රයේ සඳහන් කළ යුතුය. ඉල්ලුම් කළ දිස්ත්‍රික්කය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| පළාත | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් අංක |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 01 |
| | ගම්පහ | 02 |
| | කළුතර | 03 |
| මධ්‍යම | මහනුවර | 04 |
| | මාතලේ | 05 |
| | නුවරඑළිය | 06 |
| දකුණු | ගාල්ල | 07 |
| | මාතර | 08 |
| | හම්බන්තොට | 09 |
| උතුරු | යාපනය | 10 |
| | මන්නාරම | 11 |
| | වව්නියාව | 12 |
| | මුලතිව් | 13 |
| | කිලිනොච්චිය | 14 |
| නැගෙනහිර | මඩකලපුව | 15 |
| | අම්පාර | 16 |
| | ත්‍රිකුණාමලය | 17 |
| වයඹ | කුරුණෑගල | 18 |
| | පුත්තලම | 19 |
| උතුරු මැද | අනුරාධපුරය | 20 |
| | පොළොන්නරුව | 21 |
| ඌව | බදුල්ල | 22 |
| | මොනරාගල | 23 |
| සබරගමුව | රත්නපුර | 24 |
| | කෑගල්ල | 25 |

ආදර්ශ අයදුම්පත

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණය (MN 1 - 2016A) යටතේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය 2020.**

Open Competitive Examination for Recruitment to the post of Agrarian Research and Production Assistant Grade III under the management assistant Non - technical - Segment 2 service category (MN - 01-2016 A) in the Department of Agrarian Development-2020

| ලිඛිත විභාගයට පෙනී සිටින මාධ්‍යය |
|---|
| සිංහල - 2 |
| දෙමළ - 3 |

| දිස්ත්‍රික්කය | | දිස්ත්‍රික් අංකය |
|---|---|---|
| | | |
| | | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

- විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන දිස්ත්‍රික් හා දිස්ත්‍රික් අංකය
- (*ගැසට්* නිවේදනයේ ඇමුණුම යටතේ උපලේඛන - 1 බලන්න)

1. (i) මුල්කුරු සමග නම(මුල්කුරු අගට යොදා ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : SUNIL, A.B.)

(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(iii) සම්පූර්ණ නම (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ii) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

4. ස්ත්‍රී/ පුරුෂභාවය :- පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

5. (i) උපන් දිනය : වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

වර්ෂ : | | | මාස : | | | දින : | | |

6. විවාහක / අවිවාහක බව : විවාහක -2
අවිවාහක -1 (අදාළ කොටුව තුළ ලියන්න)

7. දුරකතන අංකය : | | | | | | | | | | |

8. අධ්‍යාපන සුදුසුකම් ඃ

8.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය ඃ

| | | |
|---|---|---|
| පළමුවර | | |
| වර්ෂය | | |
| විභාග අංකය | | |
| අනු. අංකය | විෂය | ශ්‍රේණිය |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

8.2 *අ.පො.ස. (උ.පෙළ) විභාගය ඃ*

| | | | | | |
|---|---|---|---|---|---|
| පළමුවර | | | දෙවනවර | | |
| වර්ෂය | | | වර්ෂය | | |
| විභාග අංකය | | | විභාග අංකය | | |
| අනු. අංකය | විෂය | ශ්‍රේණිය | අනු. අංකය | විෂය | ශ්‍රේණිය |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

9. වෙනත් සුදුසුකම් :————.

10. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න. ඔව් නම් විස්තරය සඳහන් කරන්න.) :

නැත ☐ ඔව් ☐

..................................................................................................
..................................................................................................

11. *විභාග ගාස්තු ඃ*

I. ගෙවන ලද ගොවිජන සේවා මධ්‍යස්ථානය :————.
II. ගෙවූ මුදල :————. III. ගෙවූ දිනය :————.
IV. ලදුපත් අංකය :————.

| |
|---|
| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) |

12. අයදුම්කරුගේ ප්‍රකාශය ඃ

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තවද, මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව සොයා ගතහොත්, එම සොයා ගැනීම තෝරා ගැනීමට පෙර සිදුවුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමකට ලක්වන බව ද දනිමි. තවද විභාග කොමසාරිස් ජනරාල් විසින්, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................................මයා /මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ ඇය මා ඉදිරිපිටදී ................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.
(නිල මුද්‍රාව)

සහතික කරන අයගේ -
නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

14. රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණි ඃ

මෙම ඉල්ලුම්කරු වන ................................................මහතා/ මහත්මිය/ මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ....................... වශයෙන් ස්ථිර/ තාවකාලික/ අනියම් සේවකයකු/ සේවිකාවක ලෙස සේවය කරන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

ආයතන ප්‍රධානියාගේ -
නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

10-1148

---

**වී හා ධාන්‍ය කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ලූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණය (MN-01 - 2016) යටතේ ගොවිජන සේවා මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2020**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිවයින පුරා පුරප්පාඩු වී ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර තනතුරට දිස්ත්‍රික් මට්ටමින් බඳවාගැනීම සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය 2021 වර්ෂයේ පෙබරවාරි මස පැවැත්වීමට කටයුතු යොදා ඇත.

1. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

1.1 ගොවිජන සේවා මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර තනතුර සඳහා කාන්තා සහ පිරිමි යන දෙපාර්ශවයටම අයදුම් කළ හැකිය.

1.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත්වේ. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු අතර රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

1.3 රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් 2009.02.20 දිනැති අංක 1589/30 ගැසට් පත්‍රයේ පළ කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අදාළ වේ.

1.4 තෝරාගනු ලබන අයදුම්කරුවන් තම මුල්පත්වීම් ලබන දිස්ත්‍රික්කය තුළ අනිවාර්යයෙන් වසර 05ක් සේවය කළ යුතුය.

1.5 තෝරාගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද යටත් විය යුතුය.

2. *සාමාන්‍ය සුදුසුකම් :*

2.1 ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

2.2 යහපත් චරිතයකින් හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු, මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

2.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි පුද්ගලයන් විය යුතුය. ("ඒ අනුව 2002.12.04 දිනට හෝ ඊට පෙර හා 1990.12.04 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත".)

2.4 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි V වන පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තකු නොවිය යුතුය.

2.5 දිස්ත්‍රික්කයකට අයත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම්.

(දිස්ත්‍රික්කයක පුරප්පාඩු සඳහා තරග කිරීමට නම් පහත සඳහන් කරුණු අතුරින් එකක් හෝ සපුරා තිබිය යුතුය.)

I. අපේක්ෂකයා එම දිස්ත්‍රික්කය තුළ ඉපදුණු අයකු විය යුතුය.

II. විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු 05ක් ඇතුළත ඔහු එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03ක් වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටින අයකු විය යුතුය.

III. අපේක්ෂකයා නොකඩවා අවුරුදු 05ක් එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීය පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතුය.

*සටහන-*

(i) යම් අපේක්ෂකයකුගේ පියා හෝ මව රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක හෝ මාරු කළ හැකි සේවයක යෙදී සිටියේ නම් එම අපේක්ෂකයාට, තම පියාගේ හෝ මවගේ හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ.

(ii) කිසියම් අපේක්ෂකයකුට එක් දිස්ත්‍රික්කයකට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. ඉහත 2.5 වගන්තිය යටතේ තරග කිරීමට දිස්ත්‍රික්කය තෝරා ගත් පසු එය නැවත වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

3. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම ;

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

4. *වෙනත් සුදුසුකම් :*

4.1 වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.

4.2 සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

5. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) දිස්ත්‍රික් මට්ටමින් අයදුම්පත් කැඳවා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍ර දෙකින්ම සමත්වන අයදුම්කරුවන්, එම පරීක්ෂණයේදී ලබා ගන්නා මුළු ලකුණු සංඛ්‍යාවේ දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙළ අනුව එක් එක් දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සම්පූර්ණ

කරනු ලැබේ. (සේවා අවශ්‍යතාව මත දිවයිනේ ඕනෑම ප්‍රදේශයකට ස්ථානමාරු කිරීමේ කොන්දේසියට යටත්ව)

(ii) එක් දිස්ත්‍රික්කයක සියලුම පුරප්පාඩු සම්පූර්ණ කළ නොහැකි අවස්ථාවකදී මුළු පුරප්පාඩු ප්‍රමාණය එම දිස්ත්‍රික්කය අයත් පළාතේ අනෙකුත් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන්ගෙන් ලබා ඇති මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සම්පූර්ණ කරනු ලැබේ.

(iii) ඉහත i හා ii අනුව සම්පූර්ණ කළ නොහැකි පුරප්පාඩු සංඛ්‍යාවක් පවතී නම් එම පුරප්පාඩු ප්‍රමාණය සියලුම අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙළ අනුව දිස්ත්‍රික් පදනම නොසලකා සම්පූර්ණ කරනු ලැබේ.

5.1 ලිඛිත තරග විභාගයේ කොන්දේසිඃ

ලිඛිත විභාගයේ එක් එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන් ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාවේ කුසලතා අනුපිළිවෙළට අනුව දිස්ත්‍රික් පදනමින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදු කෙරේ.

5.2 ලිඛිත තරග විභාගයට අදාළ විෂය නිර්දේශයඃ

විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

1. ගිණුම් - කාලය පැය 02 යි - මුළු ලකුණු 100යි
2. අවබෝධය - කාලය පැය 02 යි - මුළු ලකුණු 100යි

(සාමාර්ථ්‍යය සඳහා එක් එක් විෂයට, මුළු ලකුණුවලින් 40% ක් හෝ ඊට වැඩියෙන් අපේක්ෂකයින් විසින් ලබා ගත යුතුය.)

5.2.1. ගිණුම්

මෙම ප්‍රශ්න පත්‍රය ගණන් තැබීම පිළිබඳ මූලධර්ම හා ශේෂ පිරික්සුමක් ඇසුරෙන් වෙළෙඳ, ලාභාලාභ ගිණුම් හා විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

5.2.2. අවබෝධය

ලේඛන හැකියාව, කරුණු අවබෝධ කර ගැනීමේ හා ප්‍රකාශ කිරීමේ හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

5.3 සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ)

5.4 විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයින්ට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු දිය යුතුය.

5.5 ප්‍රතිඵල නිකුත් කිරීම.

ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයය සඳහා ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතා අනුපිළිවෙළට සකස් කරන ලද ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත ලබාදෙනු ඇත.

සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www. results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

6. වැටුප් පරිමාණය (මාසික)ඃ

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි MN-01-2016 යටතේ රු.27,140 - 10x300 - 11x350 -10x495 -10x660 - රු. 45,540/=

7. උසස් කිරීමේ පරිපාටියඃ
ගොවිජන සේවා මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර තනතුරේ බඳවා ගැනීම් පරිපාටිය අදාළ වේ.

8. අයදුම් කිරීමේ ක්‍රමයඃ

8.1 උක්ත විභාග සඳහා පෙනී සිටීමට අපේක්ෂා කරන සියලුම අයදුම්කරුවන් වෙනුවෙන් 2020.12.04 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත මෙම නිවේදනයට යා කර ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද ශීර්ෂ අංක 07 සිට 10 තෙක් දෙවන පිටුවට ද ශීර්ෂ අංක 11 සිට 14 තෙක් තුන්වන පිටුවටද ඇතුළත් වන ලෙස සකස් කර ගත යුතුය.

අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

8.2 අපේක්ෂකයා තමා විභාගයට පෙනී සිටීමට අදහස් කරනු ලබන භාෂා මාධ්‍යයෙන්, තම අත් අකුරින් ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතු අතර ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂයේ භාෂා මාධ්‍යයට අදාළ අංකය දී ඇති කොටුවේ නිවැරදිව දැක්විය යුතුය. ඉල්ලුම්කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

8.3 ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

8.4 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් උපලේඛනය - 1 යටතේ දක්වා ඇති දිස්ත්‍රික්කවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පවත්වනවා ඇත. ඒ අනුව විභාගයට පෙනී සිටින දිස්ත්‍රික්කය හා ඊට අදාළ අංක පළමු හා දෙවන කැමැත්ත අනුව ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂයේ දක්වා ඇති කොටුව තුළ නිවැරදිව සඳහන් කළ යුතුය. කිසියම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් නොමැති විට අයදුම්කරුගේ දෙවැනි කැමැත්ත අනුව හෝ ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත හෝ යොමු කරනු ඇත.යෝජිත දිස්ත්‍රික්ක සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කෙරෙනු ඇත.

8.5 පෞද්ගලික අයදුම්කරුවන් විසින් සෘජුවම ද, රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් ද 2020.12.04 දින හෝ ඊට පෙර ලැබෙන සේ සම්පූර්ණ කරන ලද අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමුකළ යුතුය. ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළින් "ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණය (MN-01 - 2016) යටතේ ගොවිජන සේවා මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2020" ලෙස සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.6 විභාග නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කොට එම ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ අලවා ඇත්ද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතුය. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

8.7 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකර විමසා සිටීම වඩාත් එලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

9. **විභාග ගාස්තු :**

අයදුම්කරු විසින් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු රු. 600/-ක මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් හෝ උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාගය සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොන යම් හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ. මතු ප්‍රයෝජනය සඳහා කුවිතාන්සියේ පිටපතක් ළඟ තබා ගැනීම සුදුසුය.

10. **රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම :**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

11. **අත්සන සහතික කිරීම :**

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු හෝ සාමදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු හෝ නීතිඥවරයකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියකු රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතුය. විභාගය ආරම්භ වන දිනයේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයයි. එසේ අත්සන සහතික නොකරන ලද ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් කරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

12. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

13. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

14. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට/ ඇයට සිදුවනු ඇත.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

16. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් වන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 06 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
තැ.පෙ. 537, කොළඹ 07.

උපලේඛන - 1

විභාග මධ්‍යස්ථාන පිහිටුවිය යුතු දිස්ත්‍රික් අංක පහත දැක්වෙන ලැයිස්තුවෙන් තෝරාගන්න.

මෙම විභාගය පහත සඳහන් දිස්ත්‍රික්කවලදී පවත්වනු ඇත. අයදුම්කරුවන් තමන් පදිංචි ලිපිනයට ආසන්නතම දිස්ත්‍රික්කය තම විභාග මධ්‍යස්ථාන ලෙස තෝරාගත යුතුය. විභාගයට පෙනී සිටින දිස්ත්‍රික් හා දිස්ත්‍රික්ක අංකය පහත සඳහන් වගුවට අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය. ඉල්ලුම් කළ දිස්ත්‍රික්කය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| පළාත | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් අංක |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 01 |
| | ගම්පහ | 02 |
| | කළුතර | 03 |
| මධ්‍යම | මහනුවර | 04 |
| | මාතලේ | 05 |
| | නුවරඑළිය | 06 |
| දකුණු | ගාල්ල | 07 |
| | මාතර | 08 |
| | හම්බන්තොට | 09 |
| උතුරු | යාපනය | 10 |
| | මන්නාරම | 11 |
| | වව්නියාව | 12 |
| | මුලතිව් | 13 |
| | කිලිනොච්චිය | 14 |
| නැගෙනහිර | මඩකලපුව | 15 |
| | අම්පාර | 16 |
| | ත්‍රිකුණාමලය | 17 |
| වයඹ | කුරුණෑගල | 18 |
| | පුත්තලම | 19 |
| උතුරු මැද | අනුරාධපුරය | 20 |
| | පොළොන්නරුව | 21 |
| ඌව | බදුල්ල | 22 |
| | මොනරාගල | 23 |
| සබරගමුව | රත්නපුර | 24 |
| | කෑගල්ල | 25 |

ආදර්ශ අයදුම්පත

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ, කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණය (MN-01 - 2016) යටතේ ගොවිජන සේවා මධ්‍යස්ථාන කළමණාකරණ සහකාර III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය 2020

**Open Competitive Examination for the Recruitment of Agrarian Service Center Management Assistant Grade III Officers under the Management Assistants Non-Technical - Segment 2 Service Category (MN - 01-2016) in the Department of Agrarian Development - 2020**

| ලිඛිත විභාගයට පෙනී සිටින මාධ්‍යය |
|---|
| සිංහල - 2 |
| දෙමළ - 3 |

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් අංකය |
|---|---|
| | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

- විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන දිස්ත්‍රික්කය හා දිස්ත්‍රික් අංකය
- (ගැසට් නිවේදනයේ ඇමුණුම යටතේ උපලේඛන - 1 බලන්න)

1. (i) මුල'කුරු සමග නම (මුල'කුරු අගට යොදා ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : SUNIL, A.B.)

(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(iii) සම්පූර්ණ නම (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ii) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

4. ස්ත්‍රී/ පුරුෂ භාවය :- පුරුෂ - 0 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
ස්ත්‍රී - 1

5. ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

6. (i) උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

වර්ෂ ☐☐ මාස ☐☐ දින ☐☐

7. විවාහක / අවිවාහක බව : අවිවාහක -1 ☐ (අදාළ අංකය කොටුව තුල ලියන්න)
විවාහක -2

8. අධ්‍යාපන සුදුසුකම් :

8.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය

| වර්ෂය | |
|---|---|
| විභාග අංකය | |

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

8.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය

| පළමුවර | | | දෙවනවර | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | | | වර්ෂය | | |
| විභාග අංකය | | | විභාග අංකය | | |
| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය | අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

9. වෙනත් සුදුසුකම් :————.

10. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න. ඔව් නම් විස්තරය සඳහන් කරන්න.) :————.

නැත ☐ ඔව් ☐

.........................................................................................
.........................................................................................

11. විභාග ගාස්තු -

I. ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය :————.
II. ගෙවූ මුදල :————. III. ගෙවූ දිනය :————.
IV. ලදුපත් අංකය :————.

ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

12. *අයදුම්කරුගේ ප්‍රකාශය :*
ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තවද, මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව සොයා ගතහොත්, එම සොයා ගැනීම තෝරා ගැනීමට පෙර සිදුවුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමකට ලක්වන බව ද දනිමි. තවද විභාග කොමසාරිස් ජනරාල් විසින්, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය :————. ————,
ඉල්ලුම්කරුගේ අත්සන.

13. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................................මයා /මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ ඇය මා ඉදිරිපිටදී ................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

සහතික කරන අයගේ -
නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාව)

14. රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණි
මෙම ඉල්ලුම්කරු වන ..............................................මහතා/ මහත්මිය/ මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ....................... වශයෙන් ස්ථිර/ තාවකාලික/ අනියම් සේවකයකු/ සේවිකාවක ලෙස සේවය කරන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

ආයතන ප්‍රධානියාගේ -
නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාව)

10-1149

---

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවේ පුහුණුව සඳහා
අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2019

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවේ පහත සඳහන් පාඨමාලාවන් සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා අයදුම්කල හැක්කේ මෙම අමාත්‍යාංශයේ නිල වෙබ්අඩවිය (www.health.gov.lk) ඔස්සේ පමණි.

| සංඛ්‍යා අංකය | සේවාව | පුහුණු පාඨමාලාවේ නම | පුහුණු කාලසීමාව | පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය |
|---|---|---|---|---|
| 1. | පරිපූරක වෘත්තීන්ගේ සේවාව | ඖෂධවේදී | වසර 02 | ඉංග්‍රීසි |
| 2. | | වෘත්තීය චිකිත්සක | වසර 02 | ඉංග්‍රීසි |
| 3. | | විකිරණ ශිල්පී | වසර 02 | ඉංග්‍රීසි |
| 4. | අතුරු වෛද්‍ය සේවාව | පාසල් දන්ත චිකිත්සක | වසර 02 | ඉංග්‍රීසි |
| 5. | | සෞඛ්‍ය කීට විද්‍යා නිළධාරී | වසර 02 | ඉංග්‍රීසි |
| 6. | | අක්ෂි තාක්ෂණවේදී | වසර 02 | ඉංග්‍රීසි |
| 7. | | අංගාදේශක හා සෘජුකරණඥ | වසර 03 | ඉංග්‍රීසි |
| 8. | | මහජන සෞඛ්‍ය පරීක්ෂක | වසර 02 | ඉංග්‍රීසි |
| 9. | | ඛන්තු රේඛන ශිල්පී | වසර 01 | ඉංග්‍රීසි |
| 10. | | විද්‍යුත් නිකපර්ණ රේඛන සටහන්කරු | වසර 02 | ඉංග්‍රීසි |
| 11. | | මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී | වසර 1 1/4 | ඉංග්‍රීසි |
| 12. | | දන්ත කාර්මික ශිල්පී | වසර 02 | ඉංග්‍රීසි |

**අංක 1 වගුව**

02. අධ්‍යාපන හා තනතුරට අදාළ වෙනත් විශේෂ සුදුසුකම්:

| සංඛ්‍යා අංකය | පුහුණු පාඨමාලාව | අ.පො.ස.(සා.පෙළ) සුදුසුකම් | අ.පො.ස.(උ.පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාල වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | ඖෂධවේදී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂාව සමත්වීම. | 2017 හා 2018 යන වර්ෂවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **රසායන විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත්වීම. | 2020.11.30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම්කළ හැකිය. |
| 02. | වෘත්තීය චිකිත්සක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂාව සමත්වීම. | 2017 හා 2018යන වර්ෂ වලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව,කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක්(02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත්වීම. | 2020.11.30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම්කළ හැකිය. |
| 03. | විකිරණ ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂාව සමත්වීම. | 2017 හා 2018යන වර්ෂවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක්(02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත්වීම | 2020.11.30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම්කළ හැකිය. |

| සංඛ්‍යා අංකය | පුහුණු පාඨමාලාව | අ.පො.ස.(සා.පෙළ) සුදුසුකම් | අ.පො.ස.(උ.පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාල වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| 04. | පාසල් දන්ත චිකිත්සක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2017 හා 2018 යන වර්ෂවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත්වීම | 2020.11.30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br><br>අයදුම්කළ හැක්කේ ස්ත්‍රී පක්ෂයට පමණි.<br><br>උස අඩි 4 යි අඟල් 10 ක් හෝ ඊට වැඩි විය යුතුය (147.3 CM)<br><br>සියලුම අයදුම්කාරියන් අවිවාහක විය යුතුය. |
| 05. | සෞඛ්‍ය කීට විද්‍යා නිළධාරී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී **ඉංග්‍රීසි භාෂාව ඇතුළුව** විෂයයන් හයකින් (06) කින් අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2017 හා 2018 යන වර්ෂවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත්වීම | 2020.11.30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br><br>අයදුම්කළ හැක්කේ පුරුෂ පක්ෂයට පමණි. |
| 06. | අක්ෂි තාක්ෂණවේදී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත්වීම | 2017 හා 2018යන වර්ෂවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත්වීම | 2020.11.30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම්කළ හැකිය. |
| 07. | අංගාදේශක හා සෘජුකරණඥ | දෙවරකට නොවැඩි වාර ගණනකදී විද්‍යාව, ගණිතය,ඉංග්‍රීසි සහ සිංහල / දෙමළ යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත්වීම | 2017 හා 2018යන වර්ෂවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව හෝ ජීව විද්‍යාව** සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව,කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත්වීම | 2020.11.30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම්කළ හැකිය. |

| සංඛ්‍යා අංකය | පුහුණු පාඨමාලාව | අ.පො.ස.(සා.පෙළ) සුදුසුකම් | අ.පො.ස.(උ.පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාල වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| 08. | මහජන සෞඛ්‍ය පරීක්ෂක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී **ඉංග්‍රීසි භාෂාව ඇතුළුව** විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත්වීම | 2017 හා 2018 යන වර්ෂවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව හෝ සංයුක්ත ගණිතය** විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත්වීම | 2020.11.30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br><br>අයදුම්කළ හැක්කේ පුරුෂ පක්ෂයට පමණි.<br><br>උස අඩි 5 යි අඟල් 2 ක් හෝ ඊට වැඩි විය යුතුය.(157.46cm) |
| 09. | ඛන්තු රේඛන ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී **ඉංග්‍රීසි භාෂාව ඇතුළුව** විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත්වීම. | 2017 හා 2018 යන වර්ෂවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයවන් දෙක (02) සහිතව විෂයයන් තුනම (03) එක් වරකදී සමත්වීම. | 2020.11.30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම්කළ හැකිය. |
| 10. | විද්‍යුත් නිකපර්ණ රේඛන සටහන්කරු | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතවදෙවරකට නොවැඩි වාර ගණනකදී **ඉංග්‍රීසි භාෂාව ඇතුළුව** විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත්වීම | 2017 හා 2018 යන වර්ෂවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, යන විෂයයන් දෙකක්(02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත්වීම | 2020.11.30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම්කළ හැකිය. |
| 11 | මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී **ඉංග්‍රීසි භාෂාව ඇතුළුව** විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත්වීම | 2017 හා 2018 යන වර්ෂවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂිවිද්‍යාළව යන විෂයයන් දෙකක්(02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත්වීම | 2020.11.30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම්කළ හැකිය. |
| 12 | දන්ත කාර්මික ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී **ඉංග්‍රීසි භාෂාව** ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත්වීම | 2017 හා 2018 යන වර්ෂවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත්වීම. | 2020.11.30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම්කළ හැකිය. |

3. **පාඨමාලාවන්ට අදාළ සුවිශේෂී කරුණු**

3.1. පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවේ පාඨමාලා සඳහා අදාළ කරුණු :

3.1.1 පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවේතනතුරුවලට බඳවා ගැනීමේ පරිපාටිවල හා ඊට වරින්වර සිදුකරනලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ගෙන් / අයදුම්කාරියන්ගෙන් බඳවා ගැනීම සිදුකරනු ලබන අතර, අයදුම්කරුවන්ගේ / අයදුම්කාරියන්ගෙන් අ.පො.ස. (උ.පෙළ) Z අගය පදනම් කරගෙන පුහුණු පාඨමාලාවට බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

3.1.2 පුහුණුව සඳහා බඳවාගනු ලබන සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ පුරෝකථනය කළ පුරප්පාඩු සංඛ්‍යාව හා පුහුණු ධාරිතාවය අනුව වේ. දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් පළාතේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් පළාතෙන් බඳවාගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.1.3 ඉන්පසු එම එක් එක් පළාතෙන් බඳවාගත යුතු සංඛ්‍යාව අදාළ පළාතෙන් එක් එක් වර්ෂයෙන් අයදුම්කර අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් / අයදුම්කාරියන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ පළාතෙන් එක් එක් වර්ෂයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.1.4 අනතුරුව එම එක් එක් වර්ෂයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව එම වර්ෂයේ ජීව විද්‍යා විෂය ධාරාව හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් අයදුම්කර අවම සුදුසුකම් සම්පූර්ණ කල අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ පළාතෙන් එක් එක් වර්ෂවලට අදාළව එක් එක් විෂයධාරා යටතේ ඉහළම Z අගය ලබා ගන්නා අයදුම්කරුවන් / අයදුම්කාරියන් අතරින් පළාත් පදනමින් තෝරා ගනු ලැබේ.

3.1.5 යම් පළාතකට ඉහත සඳහන් පරිදි වෙන් කල පුරප්පාඩු සංඛ්‍යාව එම පළාත සඳහා සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් / අයදුම්කාරියන්ගෙන් සම්පූර්ණ කල නොහැකි අවස්ථාවලදී එම පුරප්පාඩු සංඛ්‍යාව දිවයිනේ සියලු පළාත් අතර එම පළාත්වල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදාහරිනු ලැබේ.

3.2. පොදු කරුණු :

3.2.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

3.2.2 සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය ලබාදීම සඳහා බැඳී සිටිය යුතුය.

3.2.3 තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3.2.4 අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

3.2.5 පුහුණුවෙන් පසු මධ්‍යම රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් ලද හොත් ඔබ අවම වශයෙන් වසර 10 ක් වත් සේවය කිරීමට කැමති විය යුතුය.

3.2.6 තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2020.11.30 වැනි දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතුය. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කල යුතුය.

***සටහන :***

යම් අයදුම්කරුවෙකුගේ / අයදුම්කාරියකගේ පියා හෝ මව රජයේ,පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කල හැකි සේවයක යෙදී සිටීම හේතුවෙන් හෝ වෙනත් නොවැළැක්විය හැකි කරුණක් මත යම් අයදුම්කරුවෙකුට / අයදුම්කාරියකට පූර්වාසන්න වසර 03 තුළ පදිංචිය සනාථ කල නොහැකි අවස්ථාවල දී පිළිගත හැකි හේතු ඉදිරිපත් කලහොත් ඒ පිළිබඳව අවසන් තීරණය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලැබේ.

4. වෙනත් කරුණු :

4.1 මෙම පාඨමාලාවන් පූර්ණකාලීන පාඨමාලාවන් වේ. එබැවින්, සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වෙනත් කුමන පූර්ණකාලීන පාඨමාලාවන් හදාරන සිසුන් මේ සඳහා අයදුම් නොකළ යුතුය. විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් හදාරන අයෙකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා පහත (4.2) දැක්වෙන

ආකාරයට ක්‍රියාකළ යුතුය. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවක ලියාපදිංචි වී සිටින අයෙකු මේ සඳහා අයදුම් කිරීමට අදහස් කරන්නේ නම් පහත (4.3) දැක්වෙන ආකාරයට ක්‍රියාකල යුතුය. යමෙකු එලෙස (4.2) සහ (4.3) වගන්තිවලට අනුව කටයුතු නොකර මේ සඳහා අයදුම් කර, පසු අවස්ථාවකදී එය අනාවරණය වුවහොත් අදාල පාඨමාලාවෙන් / තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් රජය විසින් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

4.2 කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීනපාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිටියේ නම් හෝ සිටින්නේ නම්, මෙම පාඨමාලාවට ලියාපදිංචි කරනු ලබන දිනවන විට ඔබ එම ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතුය. ඔබ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගි නොවූ හෝ සහභාගි නොවන අයෙක් වුවද ඔබ එම ආයතනයේ සිසුවෙකු ලෙස සලකනු ලබන බැවින්, එවැනි අයදුම්කරුවන් ද තම ලියාපදිංචිය අවලංගු කරගත යුතුය.අවශ්‍ය අවස්ථාවලදී එය සනාථ කිරීම පිණිස ප්‍රමාණවත් ලිඛිත සාධක ඔබ සතුව තිබිය යුතුය.

4.3 සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි වී සිටින අයදුම්කරුවන් / අයදුම්කාරියන් වේ නම් ඔවුන් පුහුණුවට තේරී පත්වුවහොත් ඒ වනවිට ලබමින් සිටි පුහුණුවට අදාළව අත්සන් කර තිබෙන ගිවිසුම්වලට අනුව ගිවිසුම්ගත මුදල හා ඒ වනවිට ලබා ඇති සියලු දීමනාවන් ගෙවා අදාළ පුහුණුවෙන් ඉවත් වුවහොත් පමණක් ඉහත පුහුණුව සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

4.4 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම්, එම උපාධිය බලපැවැත්වෙන දිනය (EFFECTIVE DATE) පාඨමාලාවට බඳවා ගන්නා දිනට පෙර දිනයක් විය යුතුය.

4.5 2020.11.30 දින වන විට ඔබ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන පාඨමාලාවක හෝ ලියාපදිංචි වී නොසිටි අයෙකු වුව ද, යම් හෙයකින් ඉහත පුහුණු පාඨමාලාවන් සඳහා ලියාපදිංචි කරන දින වනවිට ලියාපදිංචි වී සිටියේ නම් ඔහු/ඇය ද උක්ත පුහුණු පාඨමාලාවන් සඳහා ලියාපදිංචිය ලබා ගැනීමට පෙර එම පාඨමාලාවේ ලියාපදිංචිය අවලංගු කර ගත යුතුය.

4.6 ඉහත කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණද අනිවාර්යයෙන්ම ඔබ අයදුම් කරන පාඨමාලාව සඳහා ඇතුලත් කර ගන්නේ ය යන්න මෙම *ගැසට්* නිවේදනයේ කුමන හෝ වගන්තියක් මගින් අදහස් නොකෙරෙන බව ඔබ තරයේ සිහි තබා ගත යුතුය. එමෙන්ම ඉහත කොන්දේසි සම්පූර්ණ කර තිබුණද, ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාවන් සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතුය.

4.7 අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2020.11.30 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

5. **අයදුම් කළ යුතු ක්‍රමය :**

5.1 ඉහත පුහුණු පාඨමාලාවන් සඳහා අයදුම් කළ යුත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ්අඩවිය (www.health.gov.lk) මගිනි. ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ අදාළ කොටසේ ඇති අයදුම්පත සම්පූර්ණ කර එවිය යුතුය. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් පත්‍රිකාව බලන්න.

5.2 ඔබ පාඨමාලාවන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සඳහා අයදුම් කරන්නේ නම්, වෙබ් අඩවියේ දැක්වෙන අයදුම්පතෙහි ඔබගේ මනාපයට අනුව ප්‍රමුඛතා අනුපිළිවෙලට ඒ ඒ පාඨමාලාවන් තෝරාගත යුතුය. එලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත උඩගත කිරීමෙන් පසු එහි ඔබගේ මනාපයට අනුව තෝරාගෙන සලකුණු කර ඇති පාඨමාලා අනුපිළිවෙල කිසිදු අවස්ථාවකදී කිසිදු කරුණක් මත වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.3 අයදුම්කරුවන් රු. 500 ක මුදලක් ලංකා බැංකුව, තැපැල්ලබේන් ශාඛාවේ අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුමට ගෙවිය යුතුය. ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවීම් කල හැකිය. මෙම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ.

5.4 මෙලෙස ඔබ විසින් සාර්ථකව උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි පිටපත් **තැපැල් මගින් මෙම අමාත්‍යාංශය වෙත එවීමට අවශ්‍ය නොවේ. එහෙත්, අයදුම්පත උඩගත කිරීමෙන් අනතුරුව ලැබෙන අංක 5කින් යුත් කේතය, මුද්‍රිත පිටපත් පසුව ලබා ගැනීමේ පහසුව සඳහා සුරක්ෂිතව තබාගන්න.** එසේම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් (PRINTOUT) ලබාගෙන එහි අදාළ ස්ථානයේ ඔබගේ අත්සන යොදා අත්සන සහතික කරවාගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවුව හොත් රැගෙන ආයුතුය. (6වැනි කොටස බලන්න)

**සටහන:-**
අයදුම්පත සම්පූර්ණ කිරීමේදී ඔබට යම් ගැටලුවක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් සතියේ වැඩකරන දින පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා කාලය තුළ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයේ දුරකථන අංක 0112 340 007 ඇමතීමෙන් මේ සම්බන්ධයෙන් උපදෙස් ලබාගත හැකිය.

6. අයදුම්කරුගේ /අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම :

6.1 ශ්‍රීලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/ අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 512148/- කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ / අයදුම්කාරියගේ අත්සන සහතික කල යුතුය.

6.2 රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය. එමෙන්ම, මෙය බාහිර බඳවා ගැනීමක් බව සිහි තබා ගත යුතුය.

6.3 මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සම්මුඛ පරීක්ෂණයට ඔබ කැඳවුම් ලැබුවහොත් ඔබ විසින් ඉදිරිපත් කල යුතු තොරතුරු:

7.1 ඔබ විසින් සාර්ථකව උඩගතකර ඇති විද්‍යුත් අයදුම්පත අනුව අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සේවා ව්‍යවස්ථාවන්ට හා මෙම *ගැසට්* නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලිපිලේඛනයන්හි **මුල් පිටපත්** ඉදිරිපත් කල යුතුය.

7.2 විද්‍යුත් මධ්‍යයෙන් උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි මුද්‍රිත පිටපත (ඔබගේ අත්සන සහතික කරන ලද)

7.3 උප්පැන්න සහතිකය

7.4 අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද)

7.5 අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද)

7.6 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියැදුරු බලපත්‍රය

7.7 බැංකුවට මුදල් ගෙවූ රිසිට්පත

7.8 පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය

7.9 අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ රු. 50 ක මුද්දරයක් මත අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශය.( මෙය පාසැල් දන්ත චිකිත්සක පාඨමාලාවට පමණක් අදාල වේ.)

7.10 ඔබ දැනටමත් විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී නොමැති නම් ඒ බවද ලියාපදිංචි වී සිටිනම් ඒ පිළිබඳ විස්තර සඳහන් කර ඔබව ඉහත පාඨමාලාවකට තෝරාගතහොත් දැනටමත් ලියාපදිංචි වී ඇති පාඨමාලාවෙන් නිත්‍යානුකූලව/ගිවිසුම් ප්‍රකාරව ඉවත්වන බවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන බහුමාන සහතිකය. (මෙය ඔබ විසින්ම ලියනු ලබන ලිපියකි. එය වෙනත් අයෙකු විසින් සහතික කලයුතු නොවේ.)

සටහන:

(අ) තව ද, ඉහතින් සඳහන් (7.3) සිට (7.7) දක්වා වන ලේඛනයන්හි තමා විසින්ම සහතික කරන ලද ඡායා පිටපත්, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමේදී රැගෙන ආ යුතුය.

(ආ) පුහුණු පාසල්වල පවතින ඉඩ පහසුකම් හා සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවාගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු වගන්ති කිසිවකින් අදහස් නොවන අතර එසේ තේරුම් ගත යුතු ද නොවේ.

(ඈ) සම්මුඛ පරීක්ෂණයෙන් පසු තෝරාගත් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු http://www.health.gov.lk වෙබ් අඩවියේ පළකරනු ලබන අතර කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

8. *පුහුණු කිරීමේ පරිපාටිය* -

8.1 සම්මුඛ පරීක්ෂණයට ලක්කරන ලද අයදුම්කරුවන් / අයදුම්කාරියන් අතුරින් තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් අදාළ පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට ඇතුලත් කරනු ලැබේ. පාඨමාලා කාලය සහ හැදෑරිය යුතු මාධ්‍යය අංක I වගුවේ දක්වා ඇත.

8.2 පුහුණු පාසල්වලට ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් කලින්කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

8.3 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ විභාග, නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන හෝ පුහුණුවට බඳවා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බවට හෙලි වුවහොත් හෝ අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවකදී වන්දි ගෙවීමකින් තොරව අවසන් කල හැකිය.

8.4 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන V හි විධිවිධාන වලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

8.5 පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම ලදහොත් අවම වශයෙන් වසර දහයක (10) කාලපරිච්ඡේදයක් රාජ්‍ය සේවය යටතේ/පළාත් රාජ්‍ය සේවය යටතේ අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතුය. ඉහත 8.3 කරුණු ප්‍රකාරව, පුහුණු කාලසීමාව තුළදී පුහුණුවෙන් ඉවත් වුවහොත්, පුහුණුව හැරගියහොත්, පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් ඉහත පරිදි අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුළ දී ඔහුට හෝ ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරණ ලද වියහියදම් හා ගිවිසුම්ගත මුදල ඔහු හෝ ඇය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතුය. එසේ නොමැති වුවහොත්, එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාර නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

8.6 පාසල් දන්ත චිකිත්සක පුහුණුවට අයදුම්කරන අයදුම්කාරියන් අයදුම්පත් එවන දිනය වනවිට අවිවාහක වියයුතු අතර, පුහුණුව ලබන කාලය තුළ දී ද අවිවාහකව සිටීම අනිවාර්යය වේ.

9. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්:*

9.1 පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත්, පුහුණුව අවසන් කරන දිනය වන විට පවත්නා පුරප්පාඩු මත සකස් කරන ප්‍රමුඛතා පුරප්පාඩු ලේඛනය අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත ස්ථාන මාරු ලබා දීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා පුහුණුව සාර්ථකව නිමකර අවසන් පරීක්ෂණය සමත්වන අභ්‍යාසලාභීන්ගේ පුහුණු පාඨමාලාවේ අවසන් පරීක්ෂණ කුසලතාවය සැලකිල්ලට ගෙන අදාළ තනතුරේ III වන පංතියේ තනතුරකට පත් කිරීම සඳහා සලකා බලනු ලැබේ. එමෙන්ම තෝරාගනු ලබන අයදුම්කරුවන් / අයදුම්කාරියන් පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා පත්කිරීමට යටත්වේ.

9.2 පුහුණු කාලය අවසානයේදී ස්ථිර පත්වීම් ප්‍රදානය කළහොත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

9.3 අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කල යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු ඉහත කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/තනතුරෙන් පහ කරන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුලත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තවද, පුහුණු කාලය තුළදී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව රජය විසින් දරණ ලද වියහියදම් හා ගිවිසුම්ගත අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

9.4 තෝරාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අදාල පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් / අයදුම්කාරියන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

9.5 ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝගවලට, සේවා ව්‍යවස්ථාවල විධිවිධානයන්ට, රජයේ මුදල් රෙගුලාසි වලට, රජයේ චක්‍ර ලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාලව වරින්වර පනවනු ලබන නියමවලට හා සංශෝධනවලට ද යටත් වනු ඇත.

9.6 පුහුණුවට බඳවාගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අය කරනු ලැබේ.

9.7 මෙම පුහුණු කාලසීමාව තුළදී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එසේම, පුහුණුවෙන් පසුව ඔබ අදාල තනතුරේ පත්වීම් ලදහොත්, අනුමැතිය ලබාදී ඇති තනතුරුවල හැර අනෙක් තනතුරු දරන්නන්ට පෞද්ගලික සේවයේ යෙදීමට කිසිදු අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදුකර අනාවරණය වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

9.8 පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටලු සහගත තත්ත්වයක් උදාවුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

වෛද්‍ය එස්. එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2020 ඔක්තෝබර් මස 12 වැනි දින
" සුවසිරිපාය ",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ - 10

10 - 1075

## සංශෝධනයයි

### ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු සහ අපදා කළමනාකරණ රාජ්‍ය ආමාත්‍යාංශය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත - බණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරී තනතුර II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019 (2020)

අංක 2,193 දරන 2020 සැප්තැම්බර් මස 11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ''ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත - බණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරී තනතුර II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019 (2020)" විභාග නිවේදනයේ, 2 ඡේදය සහ 2.2 කොටස, දිවයින තුළ පවත්නා කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

2. අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනය 2020 නොවැම්බර් මස 20 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

2.2 විභාග දිනය - මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලබන දිනෙක කොළඹ දී පැවැත්වෙනවා ඇත.

02. එම ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින් ම බලපැවැත්වේ.

යූ. වී. සරත් රූපසිරි,
ආගමන හා විගමන පාලක ජනරාල්,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව.

2020 ඔක්තෝබර් මස 15 වැනි දින,
සුහුරුපාය,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

10 - 1111/1

---

## සංශෝධනයයි

### ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත - බාණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරී තනතුර II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2019 (2020)

අංක 2,193 දරන 2020 සැප්තැම්බර් මස 11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ''ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත - බණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරී තනතුර II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2019 (2020)" විභාග නිවේදනයේ, 2 ඡේදය දිවයින තුළ පවත්නා කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

2. අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනය 2020 නොවැම්බර් මස 20 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

2.2 විභාග දිනය - මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලබන දිනෙක කොළඹ දී පැවැත්වෙනවා ඇත.

02. එම ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින් ම බලපැවැත්වේ.

යූ. වී. සරත් රූපසිරි,
ආගමන හා විගමන පාලක ජනරාල්,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව.

2020 ඔක්තෝබර් මස 15 වැනි දින,
සුහුරුපාය,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

10 - 1111/2

## සංශෝධනයයි

### රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව

අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත සීමිත තරග විභාගය - 2019 (2020)

2020.10.23 වැනි දින පළ කරන ලද අංක 2199 ගැසට් පත්‍රයේ 10 - 1066 හා 10 - 1067 නිවේදන පහත ඡේදය ඇතුළත් කිරීමෙන් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

"කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඉහත විභාගය සඳහා අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය 2020.11.06 වැනි දින සිට නැවත දැනුම් දෙන තුරු දීර්ඝ කර ඇති බව දන්වා සිටිමි."

ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර,
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන),
ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවට.

10 - 1227

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.